# <u>ප්‍රසම්පාදන දැන්වීමයි.</u>

මීගමුව මහා නගර සභාව තුළ පිහිටි ආපන ශාලාව 2026.09.01 සිට 2027.12.31 දින දක්වා කාලයක් සඳහා පවත්වාගෙන යාමට සුදුසු ආයතනයක් හෝ පුද්ගලයෙක් තෝරා ගැනීම සඳහා ප්‍රාදේශීය වශයෙන් ලංසුපත් කැඳවනු ලැබේ.

<u>ලංසු ඉදිරිපත් කිරීම සඳහා විස්තර හා කොන්දේසි</u>

- ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල - රු. 5000.00
- ආපසු නොගෙවනු ලබන පෝරම ගාස්තුව - රු. 1000.00
- ලංසු ලියවිලි නිකුත් කිරීම - 2026.08.14 සිට 2026.08.21 දක්වා ප.ව.2.00 මිශ්‍ර ආදායම් අංශයෙන්
- ලංසු අයදුම්පත් භාර ගැනීම - 2026.08.21 දින ප.ව 2.15 දක්වා
- ලංසු අයදුම්පත් විවෘත කිරීම - 2026.08.21 දින ප.ව 2.30
- අවම මිල (මාසකට) - රු. 20,000.00

01. ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.
02. සභාවෙන් නිකුත් කරනු ලබන ප්‍රසම්පාදන ආකෘති පත්‍ර නිසි පරිදි සම්පූර්ණ කර මුල් පිටපත හා දෙවන පිටපත වෙන වෙනම කවරවල බහා කවරයේ වම්පස ඉහළ කෙළවරේ **'ආපන ශාලාව සඳහා මිළ ගණන්'** යනුවෙන් සඳහන් කර, මුද්‍රා තබා නාගරික කොමසාරිස්, මහා නගර සභාව, මීගමුව යන ලිපිනයට නියමිත දින නියමිත වේලාවට පෙර ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ පැමිණ නාගරික කොමසාරිස් කාර්යාලයේ ඇති පැරණි ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් මිළ ගණන් ඉදිරිපත් කළ හැක.
03. ඉදිරිපත් නොකරන අයදුම්පත්, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර ජයග්‍රාහී ටෙන්ඩර්කරු ටෙන්ඩරය භාර නොගන්නා විට ඇප තැම්පත් මුදල සභාව සතු කරනු ලැබේ.
04. ජයග්‍රාහී ලංසුකරු දැනුම් දෙනු ලබන දිනට පැමිණ නියමිත මුදල ගෙවා ගිවිසුම්ගත විය යුතුය.
05. නගර සභාවට ගෙවනු ලබන සියලුම ගෙවීම් (තැන්පත් හැර ) රජයේ අනුමත බදු මුදලට යටත් වන බැවින් බදුකරු එම බදු මුදල් ගෙවීමට බැඳී සිටි.
06. 50 වැඩි සේවක සංඛ්‍යාවක් සිටින ආයතනයක ආපනශාලාවක් සිදු කර වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු අතර පළපුරුද්ද සනාථ කරන ලේඛන මිළ ගණන් සමඟ ඉදිරිපත් කළ යුතුය.
07. පහත සඳහන් ලියවිලි ප්‍රසම්පාදන අයදුම්පතට අමුණා තිබිය යුතුය.

I.2025 වර්ෂයට ලබාගත් ව්‍යාපාර ලි.ප. සහතිකය/වෙළඳ බලපත්‍රය - (ආයතන සඳහා පමණක් අදාළ වේ.)

II.පලපුරුද්ද සනාථ කරන ලේඛන.

08. මාස තුනකට වරක් ආහාර පිළියෙල කිරීමේ සිට පාරිභෝගිකයා දක්වා ක්‍රියාවලියේ පිරිසිදු භාවය සහ සෞඛ්‍ය ආරක්ෂිත බව පිළිබඳ මහජන සෞඛ්‍ය පරීක්ෂක වාර්තාවක් බදු කරු ලබා ගෙන සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.
09. ප්‍රධාන මහජන සෞඛ්‍ය පරීක්ෂක / මහජන සෞඛ්‍ය පරීක්ෂක නිර්දේශ කරන උපකරණ පමණක් ආහාර පිළියෙල කිරීම සඳහා ආපන ශාලාව තුල පරිහරණය කළ හැක.
10. ඉදිරිපත් කරන මිල ගණන් ටෙන්ඩර් ලියවිලි විලට ඇතුළත් ආකෘති පත්‍රයේ අනුව විය යුතුය.
11. මේ සමග අමුණා ඇති මිළ ගණන් ආහාර සැපයිය යුතු උපරිම මිළ ගණන් වේ.

12. ගිවිසගත් කුලිය සෑම මසකම 10 දිනට පෙර ගෙවිය යුතු අතර, ගෙවීම් ප්‍රමාද වීමකදි 5%ක දඩ මුදලක් අය කරනු ලැබේ. මාසික කුලී ගෙවීම මාස 02ක් ප්‍රමාද කීරීම මත ගිවිසුම අවලංගු කිරීමට නාගරික කොමසාරිස් හට හැකියාව ඇත.
13. මාස 03ක කුලී මුදල තැන්පතුවක් ලෙස ආරම්භයේදී එකවර ගෙවිය යුතුය.
14. තැන්පතුවක් ලෙස තබන මාස 03 ක කුලී මුදල සඳහා පොලී මුදලක් නොගෙවනු ලබන අතර, යම් අලාභහානියක් / පාඩුවක් සිදු වුවහොත් තැන්පත් මුදලින් අය කර ගැනීමට යටත් වේ.
15. සතියේ දිනවල පෙ.ව. 6.00 සිට ප.ව. 5.00 දක්වා විවෘතව තැබිය යුතුය. නගර ශාලා භාරකරුගේ එකඟතාවය ඇතිව විවෘතව තබන කාලය වැඩිකර ගත හැක.
16. ජයග්‍රාහී බදුකරු ලෙස තේරිපත් වන අය බදුකරය භාර නොගැනීම හෝ අතරමඟ දී බදුකරය හැර යාම සිදු කළහොත් එම බදුකරුගේ නම අසාදු ලේඛනගත කරන අතර, තැන්පත් මුදල ද ආපසු ගෙවනු නොලැබේ.
17. මෙම ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් අවසාන තීරණය මීගමුව මහා නගර සභාව සතු වේ.

2026.08.14දිනදීය.

නාගරික කොමසාරිස්
මහා නගර සභාව
මීගමුව.